## රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 173.

මගේ අංකය: 2/9/771 (එච්)
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1980 ජූලි 31 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරු,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා ප්‍රධානීන් වෙත.

### 1980 ජූලි වැඩ වර්ජනය - සේවය අතහැර යෑම.

1980 ජූලි 22 දිනැති අංක 168 සහ ජූලි 24 දිනැති අංක 170 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ පිළිබඳවයි.

02. 1980.07.18 වන දින හෝ ඊට පසුව හෝ සේවය සඳහා වාර්තා නොකිරීමේ හේතුවෙන් තනතුර අතහැර ගිය රජයේ නිලධරයෙකුට හෝ රාජ්‍ය සංස්ථා සේවකයෙකුට හෝ නැවත වැඩ භාරගැනීමට අවසර නො දිය යුතුයයි දැන් තීරණය කර ඇත.

03. නැවත සේවයෙහි යොදවන මෙන් එවැනි නිලධරයන්ගෙන් ලැබෙන සියලුම අභියාචනා තීරණය සඳහා අදාළ අමාත්‍ය මණ්ඩල ඇමතිතුමා වෙත ඉදිරිපත් කළයුතුය.

04. රාජකාරියට නො පැමිණීම ගැන අදාළ අමාත්‍ය මණ්ඩල ඇමතිතුමාට එකඟ යන අන්දමේ සාධාරණ හේතු දක්වා ඇති නිලධරයන් නැවත සේවයට යොදවා ගන්නා දිනය අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කෙරෙනු ඇත.

05. අංක 168 සහ අංක 170 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල විධිවිධාන යටතේ නැවත සේවය සඳහා වාර්තා කිරීමට අවසර දී ඇති නිලධරයන් පිළිබඳ කරුණුද සමාලෝචනය සඳහා අදාළ අමාත්‍ය මණ්ඩල ඇමතිතුමා වෙත යොමුකළ යුතුය.

වැඩබලන ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.